

# මහ මැතිවරණයට තරග කරන දේශපාලන පක්ෂ පළාත් සභා ක්‍රමය ගැන ස්ථාවරය පැහැදිලි කළ යුතුයි

## මිලින්ද මොරගොඩ

මහ මැතිවරණයට තරග කරන සියලු දේශපාලන පක්ෂ, දැනට අක්‍රිය වී ඇති පළාත් සභා ක්‍රමය ගැන සිය පැහැදිලි ස්ථාවරය ජනතාව හමුවේ තැබිය යුතු බව හිටපු අමාත්‍ය, පාත්ෆයින්ඩර් පදනමේ නිර්මාතෘ මිලින්ද මොරගොඩ මහතා නිවේදනයක් නිකුත් කරමින් කියා සිටියි. දහතුන් වැනි සංශෝධනයෙන් ඇති කරන ලද මෙම ක්‍රමය අහෝසි කරන පියවර ගත යුතු බවද හෙතෙම වැඩිදුරටත් අවධාරණය කර තිබේ.

පළාත් සභා අහෝසි කිරීමෙන් පසු පළාත් පාලන ආයතන ශක්තිමත් කළ හැකි අතර මහ නගර සභා, නගර සභා සහ ප්‍රාදේශීය සභා ජනතාවගේ එදිනෙදා අවශ්‍යතා ඉටු කරන සමීප පරිපාලන ව්‍යුහය වශයෙන් පවත්වාගෙන යා හැකි බවද පෙන්වා දෙයි. 13 වැනි සංශෝධනය 1987 දී ක්‍රියාත්මක කර තිබේ. පළාත් මට්ටමින් බලය බෙදා හැරීමෙන් ශ්‍රී ලංකාවේ ජනවාර්ගික ගැටලුවලට විසඳුමක්වනු ඇතැයි අපේක්ෂා කළේය. එහෙත් අකාර්යක්ෂම, මුදල් නාස්ති කරන සහ ජනතාවට ප්‍රයෝජනයක් නැති තත්ත්වයට පත්ව තිබේ. පළාත් සභා අහෝසි කර ඒ වෙනුවට සෙනෙට් මණ්ඩලයක් පත් කළහොත් අඩුම තරමින් බෙදීම් තුරන් කරන විද්වත් මණ්ඩලයක් වශයෙන් ක්‍රියා කරනු ඇති බවද මිලින්ද මොරගොඩ මහතා දක්වයි.

කරුණු දෙකක් මෙහිදී දේශපාලන පක්ෂවල අවධානයට ඉදිරිපත් කර තිබේ. වසර දෙකකට ආසන්න කාලයක් පළාත් සභා විසුරුවා හැර අක්‍රියව ඇති බව පළමු කාරණයෙන් පෙන්වා දෙයි. සබරගමුව (2018 සැප්. 26), නැගෙනහිර (2018 සැප්. 30), උතුරු මැද (2018 ඔක්. 01), මධ්‍යම (2018 ඔක්. 08), වයඹ (2018 ඔක්. 10), උතුර (2018 ඔක්. 25), දකුණ (2019 අප්‍රි. 10), බස්නාහිර (2019 අප්‍රි. 21) සහ ඌව (2019 සැප්. 08) වැනි දින සිට නිල කාලය අවසන් වීමෙන් හෝ විසුරුවා හැරීමෙන් පසු ජනතා නියෝජනයක් රහිතව පවතී. මෙම කාලය තුළ ජන ජීවිතයට අපහසුතාවක් වී තිබේ දැයි මහජනතාව තීරණය කළ යුතුය. පළාත් සභා ක්‍රමය වෙනුවෙන් වාර්ෂිකව රු. බිලියන 250ක් වැය කරන බව මිලින්ද මොරගොඩ මහතා සිය නිවේදනයේ මතු කරන දෙවැනි කාරණය වශයෙන් දක්වයි.